සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

40552

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

11 | S | I

## දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
## Second Term Test, July 2018

11 ශ්‍රේණිය
Grade 11

බුද්ධ ධර්මය - I
Buddhism - I

පැය එකයි
One hour

විභාග අංකය ..................................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (x) ලකුණ යොදන්න.

---

(01) තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම පංච මහා විලෝකන නම් වේ. එම පංච මහා විලෝකනවලට අයත් වන්නේ,

1. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුබ
2. අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන, ප්‍රඥා
3. ඡන්ද, චිත්ත, විරිය, විමංසා, විරති
4. කාලය, දීපය, දේශය, කුලය, මව

(02) සිදුහත් බෝසතාණන් වහන්සේ මව් කුස පිළිසිඳ ගත්තේ,

1. වෙසක් පෝය දිනයි.
2. පොසොන් පෝය දිනයි.
3. ඇසළ පෝය දිනයි.
4. දුරුතු පෝය දිනයි.

(03) ලොව උපන් සත්ත්වයාට අනිවාර්යයෙන් ම මහළු වීම, ලෙඩ වීම, මරණයට පත් වීම යන දුක් පීඩාවන්ට ගොදුරු වීමට සිදුවන බව සිදුහත් කුමරා වටහා ගත්තේ,

1. මව කළුරිය කිරීම හේතුවෙනි.
2. සතර පෙර නිමිති දැකීමෙනි.
3. මහල්ලෙක් දැකීමෙනි.
4. සර්වමිත්‍ර බමුණාගේ ප්‍රකාශය ඇසීමෙනි.

(04) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු කළ ප්‍රථම උදාන වාක්‍යය වන්නේ,

1. අග්ගෝ හමස්මි ලෝකස්ස..........
2. නිබ්බුතා නූන සා මාතා................
3. අනේක ජාති සංසාරං...........
4. අනිච්චාවත සංඛාරා................

(05) ''රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං..'' යනුවෙන් සිදුහත් කුමරුගේ මුවින් පිටවූයේ,

1. පුත් කුමරුගේ උපත පැවිදි වීමට බාධාවක් බව සිතීමෙනි.
2. පුත් කුමරුගෙන් වෙන්වීම දුකක් වූ බැවිනි.
3. පුත් කුමරුගේ උපත සියලු දෙනාටම බන්ධනයක් වන බැවිනි.
4. ඉහත කරුණු සියල්ලම හේතුවෙනි.

(06) සිත කිළිටි කරන කුසල් සිත්වලට බාධා කරන පිහිවිලි දහමෙහි හැඳින්වෙන්නේ,

1. අකුසල් නමිනි. 2. නීවරණ නමිනි 3. චෛතසික නමිනි 4. විරමණ නමිනි

(07) බෞද්ධයාට ජීවිතාදර්ශ ලබා දෙන බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථයක් වන ධම්මපදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

1. ඛුද්දක නිකායට 2. සංයුත්ත නිකායට 3. මජ්ඣිම නිකායට 4. දීඝ නිකායට

(08) පිංකිරියවතක්, ධනයක්, රාජධර්මයක්, පාරමිතාවක්, ගිහි පැවිදි සැමට පැපයත් හා සියලු සුවඳ ඉක්මවා යන සුවඳක් ලෙස ද බුදු දහමේ හඳුන්වා ඇත්තේ,

1. දානයයි 2. සීලයයි 3. පරිත්‍යාගයයි 4. භාවනාවයි

(09) "සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්" යනුවෙන් සිංහලයන් ද අවදි කරගෙන ලෝක බෞද්ධයින්ගේ සහාය ඇතිව දඹදිව සිද්ධස්ථාන බෞද්ධයන් ට ලබා ගැනීමට නීතිමය කටයුතු ඉටු කරන ලද්දේ,

1. ඔල්කට් තුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. වැලිවිට සරණංකර හිමි ය.
4. අනගාරික ධර්මපාල තුමා ය.

(10) අ. මට්ටකුණ්ඩලීට පිහිට වීම.
ආ. අංගුලිමාල දමනය කිරීම.
ඇ. යක්ෂයෙකුට බිලිවීමට ගිය ආලවක කුමරු බේරා ගැනීම.
ඉ. නාලාගිරි හස්තියා දමනය කිරීම.
ඊ. හඳවතිකා ඇතින්නට පිහිට වීම යන අවස්ථා අතරින් බුදු රජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා වන්නේ,

1. අ ඇ ඊ
2. අ ආ ඇ
3. ඇ ඉ ඊ
4. අ ඉ ඊ

(11) අප තෙරුවන් සරණ යා යුත්තේ,

1. ශ්‍රද්ධාව මුල් කරගෙන ය.
2. ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් මුල්කරගෙන ය.
3. ප්‍රඥාව මුල්කරගෙන ය.
4. භක්තිය මුල් කරගෙන ය.

(12) තෙරුවන් ගුණ ප්‍රමාණය වන්නේ,

1. තුනකි.
2. හයකි.
3. විසි හතරකි.
4. නවයකි.

(13) තමා විසින් ම පිළිපැද ඇස්පනාපිට ම මෙලොවදී ම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් සංඝරත්නය,

1. අකාලික නම් වේ.
2. සන්දිට්ඨික නම් වේ.
3. ස්වාක්ඛාත නම් වේ.
4. ඕපනයික නම් වේ.

(14) බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,

1. බුදුන් සරණ යාමයි.
2. දහම් සරණ යාමයි.
3. පන්සිල් සමාදන් වීමයි.
4. තෙරුවන් සරණ යාමයි.

(15) බුදු රජාණන් වහන්සේගේ තාදී ගුණය ලෙස හැඳින්වෙන්නේ,

1. අසරණයින්ට පිහිට වීමේ ගුණයයි.
2. අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණයයි.
3. පුරිස ධම්ම සාරථී ගුණයයි.
4. මහා කාරුණික ගුණයයි.

(16) අපට උදව්කරන ලද සතෙකුට වුවද කළ ගුණ සැලකිය යුතු ය. එසේ තිරිසන් සතෙකුට වුව ද කළගුණ සැලකීම කළ යුතු බව බුදුන් වහන්සේ පෙන්වා දුන් අවස්ථාවක් වන්නේ,

1. හඳුවතිකා ඇතින්නට පිහිටවීම පිළිබඳ උදේනි රජතුමාට ප්‍රකාශ කළ අවස්ථාව.
2. ගැරඩියෙකුට හිංසා කළ දරුවන්ට එහි අනිසි විපාක පෙන්වා දුන් අවස්ථාව
3. නාලාගිරි ඇතා දමනය කළ අවස්ථාව.
4. පාරිලෙය්‍ය ඇතා බුදුන් වහන්සේට උපස්ථාන කළ අවස්ථාව

(17) බුදු බව ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් සම්පූර්ණ කරන උතුම් පිළිවෙත් වන්නේ,

1. දස සක්විතිවත්
2. දස පුණ්‍ය ක්‍රියාය
3. දස රාජ ධර්ම
4. දස පාරමිතා

(18) බෝසතාණන් වහන්සේ දාන උප පාරමිතාව සම්පූර්ණ කළ බව දක්වෙන ජාතක කතාව වන්නේ,

1. වෙස්සන්තර ජාතකය
2. සිවි ජාතකය
3. සස ජාතකය
4. උම්මග්ග ජාතකය

(19) වණ්ණුපථ ජාතකය තුළින් දක්වෙන්නේ බෝසතාණන් වහන්සේ කුමන පාරමිතාවක් සම්පූර්ණ කළ ආකාරය ද?

1. වීර්ය පාරමිතාව
2. උපේක්ෂා පාරමිතාව
3. සීල පාරමිතාව
4. ප්‍රඥා පාරමිතාව

(20) සතර සතිපට්ඨානයට අයත් වන්නේ,

1. ඡන්ද, චිත්ත, විරිය, විමංසා
2. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව
3. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
4. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සනා

(21) මෙරට පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවාගනු ලැබුවේ,

1. රීස් ඩේවිඩ්ස් පඬිතුමා
2. ඕල්කට් තුමා
3. අනගාරික ධර්මපාලතුමා
4. වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා

(22) නිදිබර බව, උදාසීනකම හේතුවෙන් පාඩම් කළ කිසි දෙයක් මතකයට නගා ගත නොහැකි යයි චතුර පැවසුවේ ය. චතුර තුළ ඇති නීවරණ ධර්මය වන්නේ,

1. ථීනමිද්ධය
2. කාමච්ඡන්දය
3. විචිකිච්ඡාවයි
4. ව්‍යාපාදයයි.

(23) බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමික ආරාමවලට පවා වැඩම කරමින් වෙනත් ආගමික උතුමන් සමඟ සුහද සාකච්ඡා සිදුකළහ. ඉන් ප්‍රකට වන්නේ උන් වහන්සේ තුළ පැවතියේ,

1. ආගමික සහජීවනයයි.
2. අවිහිංසාවාදී ප්‍රතිපත්තියයි.
3. නිරහංකාර බවයි.
4. චරිතවත් බවයි.

(24) සමථ භාවනාව වඩන පුද්ගලයා තෝරාගත යුතු අරමුණු ලෙසින් කර්මස්ථාන ගණන

1. හතකි.
2. තිහකි.
3. විස්සකි.
4. හතළිහකි.

(25) කම්මට්ඨානාචාර්යවරයකුගේ උපදෙස් නොලබා තම අභිමතය පරිදි කමටහනක් භාවනා කළ ද ප්‍රතිඵල නොලද භික්ෂුවක් වන්නේ,

1. රාහුල හිමි.
2. චූළපන්ථක හිමි
3. ස්වර්ණකාර හිමි
4. මුගලන් හිමි

(26) ශීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමු වීමේ දී පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංගයකි, සන්තුට්ඨිතාව මෙහි සන්තුට්ඨිතාව යන්නෙන් අදහස් වන්නේ,

1. පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි.
2. ලද දෙයින් සතුටු වීම.
3. හිඳීම, සිටීම, ඇවිදීම ආදි සියලු ක්‍රියාවන්හි අවබෝධයෙන් යුතු වීමයි.
4. ඇස කන නාසය ආදි ඉන්ද්‍රියන් සංවර කර ගැනීමයි.

(27) ඇත්ත ඇති සැටියෙන් දකින නුවණ බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ,

1. සඤ්ඤා නමිනි.
2. ශීලය නමිනි.
3. පඤ්ඤා නමිනි.
4. ශ්‍රද්ධාව නමිනි.

(28) 1995 වර්ෂයේ දී අමරපුර මහා සංඝ සභාව මගින් අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන යන ගෞරව නාමය පිරිනමා ඇත්තේ,

1. වැලිවිට සරණංකර හිමියන්ට
2. වාරියපොළ සුමංගල හිමියන්ට
3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ට
4. රේරුකානේ චන්දවිමල හිමියන්ට

(29) ශික්ෂාකාමී හා අල්පේච්ඡව ජීවත් වීම, විවිධ දුෂ්කරතා මැද වුව ද අධ්‍යාපනය පිළිබඳ දැඩි ඇල්මක් දැක්වීම., නිරහංකාර බව යන ආදර්ශ දක්නට ලැබෙන්නේ,

1. රේරුකානේ චන්දවිමල හිමියන්ගේ චරිතයෙනි.
2. වැලිවිට සරණංකර හිමිගේ චරිතයෙනි.
3. දුටුගැමුණු රජතුමාගේ චරිතයෙනි.
4. අනගාරික ධර්මපාලතුමාගේ චරිතයෙනි

(30) චූළකම්ම විභංග සූත්‍රයට අනුව බොහෝ ආබාධ සහිතව ඉපදීමට හේතුව වන්නේ,

1. සත්ත්ව හිංසාව සිදු කිරීමයි.
2. සතුන් මැරීමයි.
3. ද්වේෂයෙන් කටයුතු කිරීමයි.
4. ගරු කළ යුත්තන්ට ගරු නොකිරීමයි.

(31) යමක් කිරීමෙන් පසුතැවීමට සිදුවේද විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අත් විඳින්නට සිදු වේද එබඳු ක්‍රියා නොකළ යුතු බව දක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද පෙළ වන්නේ,

1. තං ච කම්මං කතං සාධු
2. නතං කම්මං කතං සාධු
3. අත්තනාව කතං පාපං...
4. අක් කොච්ඡි මං අවධි මං

(32) පුද්ගලයාගේ චින්තනය හා විමංසනය පිළිබඳ අයිතියත් නිදහසත් අගය කරමින් බුදු රජාණන් වහන්සේ දේශනා කරනු ලැබූ සූත්‍රයක් වන්නේ,

1. ධම්මික සූත්‍රය.
2. පත්ත කම්ම සූත්‍රය.
3. කාලාම සූත්‍රය.
4. සිගාලෝවාද සූත්‍රය.

(33) තණ්හාව මුල්කොට ගෙන සමාජයේ කලහකෝලාහල ඇතිවන අයුරු පටිච්ච සමුප්පාදයට අනුව පෙන්වා දී ඇති සූත්‍රය වන්නේ,

1. අග්ගිවච්ඡගොත්ත සූත්‍රය
2. මහා නිදාන සූත්‍රය
3. චක්කවත්ති සීහනාද සූත්‍රය
4. කාලාම සූත්‍රය

(34) කුසලා කුසල කර්ම රැස් කිරීම හේතු කොටගෙන ප්‍රතිසන්ධි සිත පහළ වෙයි. යන්න ප්‍රකාශ වන්නේ,

1. සංඛාර පච්චයා විඤ්ඤාණං යන්නයි
2. තණ්හා පච්චයා උපාදානං යන්නයි.
3. විඤ්ඤාණ පච්චයා නාම රූපං යන්නයි
4. භව පච්චයා ජාති යන්නයි

(35) දිවා රාත්‍රී පිං වැඩෙන පිංකමක් වන්නේ,

1. අටපිරිකර පූජා කිරීම යි.
2. සාංඝික දානයක් දීම යි.
3. මල් පලතුරු උයන් වැවීම යි.
4. මල් පහන් පූජා කිරීම යි.

(36) භික්ෂූන් වහන්සේලාගේ කායික නිරෝගිතාව සඳහා බුදු රජාණන් වහන්සේ සක්මන් මළුව අනුමත කරන ලද්දේ,

1. ජීවක වෛද්‍ය වරයාගේ ඉල්ලීම හේතුවෙනි.
2. විශාඛා උපාසිකාවගේ ඉල්ලීම හේතුවෙනි
3. බිම්බිසාර රජුගේ ඉල්ලීම හේතුවෙනි.
4. කොසොල් රජුගේ ඉල්ලීම හේතුවෙනි.

(37) "රාග ද්වේෂාදී කෙලෙස් නිසා රෝගී වූ සිත් ඇති පුහුදුන් මිනිසුන් අතර එකී කෙලෙස්මල සියල්ල මුලින්ම සිඳ දු බුද්ධාදී උතුමෝ නිරෝගීව වසති." යනුවෙන් සඳහන් වන්නේ,

1. ධම්මපදයේ ය.
2. පූජාවලියේ ය.
3. භද්දාලි සූත්‍රයේ ය.
4. චුල්ලවග්ග පාලියේ ය.

(38) ථේරවාදී දෙවන හා තෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය දැක්වූ රජවරු පිළිවෙළින් දැක්වෙන්නේ,

1. කාලාශෝක රජු, අජාසත් රජු
2. අජාසත් රජු, කාලාශෝක රජු
3. කාලාශෝක රජු, කණිෂ්ක රජු
4. කාලාශෝක රජු, ධර්මාශෝක රජු

(39) ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ ව සිව් දිශාවට මුහුණලා තනන ලද අලංකාර තොරණ වැනි අංගයන් දකිය හැකිය. එය හැඳින්වෙන්නේ,

1. බෝධිඝරය නමිනි
2. චෛත්‍යඝර නමිනි
3. වටදාගෙය නමිනි
4. වාහල්කඩ නමිනි

(40) බුදු දහම ස්ථාපිත වීමෙන් පසු ලංකාව ඉදි වූ මුල්ම ස්තූපය වන්නේ,

1. මහියංගන චෛත්‍යය යි.
2. ථූපාරාම චෛත්‍ය යි.
3. ගිරිහඬු සෑය යි.
4. කැලණි චෛත්‍ය යි.

(ල.1 x 40 - 40)

40690

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education, Southern Province**

| 11 | S | II |
|---|---|---|

**දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි**
**Second Term Test, July 2018**

**11 ශ්‍රේණිය**
**Grade 11**

**බුද්ධ ධර්මය - II**
**Buddhism - II**

පැය දෙකයි
**Two hours**

විභාග අංකය ..............................

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) 1. "සංවෙඩති කුසල ධම්මෙ ආසෙවති වඩ්ඪෙති ඒතායාති භාවනා" යන්නෙහි අදහස ලියන්න.
2. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
3. දෙමාපියන් 'මුණ්ම' යනුවෙන් හැඳින්වෙන්නේ කුමන හේතුවක් නිසා ද?
4. පුද්ගල චරිත හයකි. ඉන් දෙකක් නම් කරන්න.
5. අනණ සුඛයේ දක්වෙන චතුර්විධ සැප නම් කරන්න.
6. සම්ජීවිකතා යනු කුමක්ද?
7. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
8. රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් වන දස සක්විතිවත් පිළිබඳ දක්වෙන්නේ කිනම් සූත්‍රයකද?
9. සිංහලයේ විශිෂ්ටතම වන කාව්‍යය වන කව්සිළුමිණ රචනා කළේ කවුරුන්ද?
10. සිගාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන්ගෙන් දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්වලින් දෙකක් ලියන්න.

(02) 1. බුදුරජාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා දෙකක් නම් කරන්න.
2. ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් දක්වන්න.
3. ඔබ ගැටලුවලට මුහුණ දීමේ දී ඉවසීමෙන් කටයුතු කරන අයුරු පැහැදිලි කරන්න.

(03) 1. පාරමිතා යන්න හඳුන්වන්න.
2. සෑම පාරමිතාවක්ම කොටස් තුනකට බෙදේ. එම කොටස් දක්වෙන ත්‍රිවිධ පාරමී නම් කරන්න?
3. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට පාරමිතා ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

(04) 1. පිනි කරන විට පසුතැවීමට සිදුනොවන සතුට දනවන ක්‍රියාවල නිරත විය යුතු බව දක්වෙන ධම්මපද ගාථාව ලියන්න.
2. ඔබ විසින් පාසලේ දී කරන ලද යහපත් ක්‍රියා තුනක් ලියන්න.
3. පුද්ගලයාගේ ජීවිතයේ සාර්ථකත්වයට ධම්මපද ගාථා ඉවහල් කරගත හැකි ආකාරය සෙවියෙන් විස්තර කරන්න.

(05) 1. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිවලින් දෙකක් නම් කරන්න.
2. සප්ත අපරිහානිය ධර්මවලින් තුනක් ලියන්න.
3. යහපත් රාජ්‍ය පාලනයක් උදෙසා බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඉවහල් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(06) 1. සීලය නිර්වචනය කරන්න.
2. ගිහි සීලයේ ප්‍රභේද තුනක් නම් කරන්න. (ගිහියන්ට සමාදන් විය හැකි සිල්)
3. සිල්වත්ව කටයුතු කිරීමෙන් පුද්ගල සංවර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
1. අනගාරික ධර්මපාලතුමා.
2. තතරවන ධර්ම සංගායනාව
3. චතුරාර්ය සත්‍යය
4. ස්තූපය